**අකුරැස්ස ප්‍රාදේශීය සභාව - 2021**

**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**-----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු ඉඩම් හා ගොඩනැඟිලි වැඩි දියුණු කිරීම සඳහා වැය කර තිබූ රු.11,172,971 ක් හා සභා කාර්යාලයේ පරිගණක ජාලගත කිරීමට වැය කරන ලද රු.540,000 ක් ප්‍රාග්ධනීත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.1,428,050 ක් වටිනා ලී බඩු උපකරණ ස්ථාවර වත්කම් යටතේ හා පොදු ගබඩා තොගය යටතේද ගිණුම්ගත කර තිබුණි. | ස්ථාවර වත්කම් යටතට ගැනෙන රු.1,428,050 ක් වූ ලී බඩු හා උපකරණ වටිනාකම පොදු ගබඩා තොග ශේෂයෙන් ඉවත් කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානය වන විට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු.5,468,084 ක ශේෂය වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | |
| (ඈ) | ස්ථාවර වත්කම් ස්වරූපයේ නොවන ඉන්වෙන්ට්‍රි හා පාරිභෝජන ස්වරූපයේ උපකරණ හා ද්‍රව්‍ය වර්ග 46 කට අයත් රු.238,355 ක් වටිනා අයිතම 744 ක් ලී බඩු හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉන්වෙන්ට්‍රි ස්වරූපයේ භාණ්ඩ ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කර ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | ඉකුත් වර්ෂය අවසානයේ පොදු ගබඩා තොගය රු.899,294 ක් අඩුවෙන් ගිණුම්ගත වීම නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් අංක 13 මගින් සමුච්චිත අරමුදලට රු.353,247 ක් හර කර එම වටිනාකම පොදු ගබඩා තොග ගිණුමට බැර කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට තොගය රු.1,252,541ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් එකතුව රු.229,509,491 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාල ශේෂයන් හා ඊට අදාල උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු. 81,262,818 ක අසමානතා පැවතුණි. | වෙනසට හේතු හඳුනාගෙන ඉදිරියේදී නිවැරදි කරන බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු.17,133,372 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු.23,377,354 ක් විය.

### 2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

**(අ) වරිපනම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වරිපනම් ඒකක සංඛ්‍යාව 3100 ක් වූ අතර වර්ෂය අවසානයට ඒකක 1220 කින් රු.1,853,144 ක හිඟ ශේෂයක් පැවතුණි. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති හිඟ මුදලින් 2022 මැයි 31 දිනට රු.259,959 ක මුදලක් අය කර ගෙන ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

**(ආ) කඩ කුලී**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ කඩ කාමර 227 ක් බදු දී තිබූ අතර වර්ෂය අවසානයට කඩ කාමර 164 කින් රු.7,874,096 ක හිඟ කඩ කුලී ද, දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව කඩ කාමර 24 කින් රු.5,464,236 ක එක්වන් මුදල් ද අය විය යුතුව තිබුණි. 2022 මැයි 31 දින වන විට එයින් හිඟ කඩ කුලී රු.1,422,808 ක් හා කඩ කාමර 03 ක් සඳහා එක්වන් මුදල් රු.1,578,500 ක් අය කරගෙන තිබුණි. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති හිඟ කඩ කුලී ආදායමෙන් රු. 1,422,808 ක් හා කඩ කාමර 03ක් සඳහා එක්වන් මුදල් රු.1,578,500 ක් අයවී ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග /රෙගුලාසි අනුව කටයුතු නොකිරීම මත අනුමත කිරීම ප්‍රතික්ෂේප කරන ලද ගොඩනැඟිලි අයදුම්පත් 06 කට අදාලව ගොඩනැඟිලි ඉදිකර අවසන් කර හෝ ඉදිවෙමින් පැවති අතර ප්‍රාදේශීය සභා නාගරික බල ප්‍රදේශයේ සංවර්ධන බලපත්‍ර ලබා ගැනීමකින් තොරව ගොඩනැඟිලි 02 ක් ඉදිකර තිබුණි. මෙම ඉදිකිරීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග /රෙගුලාසි ඇතුළත් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ 02 වන උපලේඛනය ප්‍රකාරව කටයුතු කර රු.4,602,742 ක ගාස්තු අය කර ඉදිකිරීම විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිකිරීම්කරුවන් කැඳවා ඔවුන් සමඟ සාකච්ඡා කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන හා 2020 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කර තිබූ කොන්ක්‍රීට් කාණු, පැති බැම් හා පෙට්ටි බෝක්කු ඉදිකිරීමේ කර්මාන්ත 07 කට අදාලව හැඩයම් සකස් කිරීමේදී දකුණු පළාත් ඉංජිනේරු සේවා කාර්යාලය විසින් හඳුන්වා දී තිබූ Ct – 036 රේටය වෙනුවට ST-057 රේටය භාවිතා කිරීම නිසා 2019 වර්ෂයේ පළමු භාගයේ මිල ගණන් අනුව වර්ග මීටරයකට රු. 267 බැගින් හැඩයම් වර්ගමීටර 665.64 ක් සඳහා රු.177,726 ක් කොන්ත්‍රාත්කරුවන්ට වැඩිපුර ගෙවා තිබුණි. | කොන්ක්‍රීට් කාණු, පැති බැම් හා පෙට්ටි බෝක්කු යෙදීම මාර්ග සංවර්ධන කටයුතුවලට අදාළ ව්‍යාපෘති බැවින් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ රේටයන් භාවිතා කර ඇති බව. | සුදුසු හා වාසිදායක රේටයන් භාවිතා කළ යුතුය. |